# ශ්‍රී ලාංකාවෙන් පිටත දී සිදුවු උපතක් ලියාපදිංචි කිරීම.

## *පහත සඳහන් ලියකියවිලි අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.*

1 නිසිලෙස සම්පූර්ණ කරන ලද පුරවැසි අයදුම් පත්‍රය (පුරවැසි 1) හා එහි ඡායාපිටපතක්,

2 නිසිලෙස සම්පූර්ණ කරන ලද උපතක් ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රය (B 4)

3 ඉතාලි රාජ්‍යය ආයතනයක් (COMUNE) මගින් නිකුත් කරන ලද දෙමවුපියන්ගේ නම් ඇතුලත් දරුවාගේ උප්පැන්න සහතිකය (NASCITA) හා එහි ඡායාපිටපතක්,

4 දෙමවුපියන්ගේ විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායාපිටපත් දෙකක්, (පරිවර්තනය කරන ලද සහතික මුල් පිටපත් ලෙස නොසැලකේ)

5 දරුවා ඉපදෙන අවස්ථාව වන විට දෙමවුපියන් අවිවාහක/වෙන්වී හෝ දික්කසාද වී සිටියේ නම්, මාතෘත්වය හා පීතෘත්වය සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශ,

6 දෙමවුපියන්ගේ උප්පැන්න සහතික මුල් පිටපත් හා එහි ඡායාපිටපත් දෙක බැගින්, (පරිවර්තනය කරන ලද සහතික මුල් පිටපත් ලෙස නොසැලකේ)

7 දෙමවුපියන් ශ්‍රී ලාංකාවෙන් පිටත ඉපදුනේ නම්, ඔවුන්ගේ ශ්‍රී ලාංකීය පුරවැසිභාවය සනාථ කෙරෙන ලේඛනවල මුල් පිටපත් හා ඡායා පිටපත් දෙක බැගින්,

8 දරුවා ඉපදෙන අවස්ථාව වන විට දෙමවුපියන් සතු වු ගමන් බලපත්‍ර හා ඒවායේ පහත දක්වා ඇති පිටුවල ඡායා පිටපත් දෙක බැගින්,

- දත්ත ඇතුලත් පිටුවෙහි ඡායා පිටපත්
- වෙනස් කිරීම් වලට අදාළ පිටු වල ඡායා පිටපත්

9 දෙමවුපියන්ගේ වර්තමාන ගමන් බලපත්‍ර හා ඒවායේ පහත දක්වා ඇති පිටුවල ඡායා පිටපත් දෙක බැගින්,

- දත්ත ඇතුලත් පිටුවෙහි ඡායා පිටපත්
- වෙනස් කිරීම් වලට අදාළ පිටු වල ඡායා පිටපත්

10 දරුවා ඉපදෙන අවස්ථාව වන විට දෙමවුපියන් සතු වීසා හෝ ඉතාලියේ රැඳිසිටීමේ බලපත්‍ර (SOGGIORNO) හා ඒවායේ ඡායා පිටපත් දෙක බැගින්,

ඉහත සඳහන් අනුපිළිවෙලට ලියකියවිලි ගොනු දෙකක් ලෙස සකස් කොට ඉදිරිපත් කල යුතු වේ.

ඔබ දරුවාගේ පුරවැසි සහතිකය තැපැල් මගින් ඔබගේ දේශීය හෝ විදේශීය ලිපිනයට ගෙන්වා ගන්නේ නම්, ඒ සඳහා යුරෝ 2.00 ක තැපැල් ගාස්තුවක් ගෙවිය යුතු අතර, එම තැපැල් කිරීමේ කටයුතු ශ්‍රී ලාංකාවේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පුරවැසි අංශය මගින් සෘජුවම සිදු කරනු ලබන බැවින් ඒ පිළිබඳව මෙම තානාපති කාර්යාලයට වගකීමක් නොමැති බවද කාරුණිකව දැනුම් දෙමු. *(අයදුම් පත්‍රය පිරවීමට ප්‍රථම එහි පසුපිට සඳහන් උපදෙස් පත්‍රිකාවේ උපදෙස් අනුගමනය කරන ලෙස වැඩි දුරටත් දැනුම් දෙමු)*


තානාපති කාර්යාලීය වෙබ් අඩවිය - **www.srilankaembassyrome.org**
දුරකථන අංක - **06.8840801 - 06.8554560**
විද්‍යුත් ලිපිනය - **embassy@srilankaembassyrome.org**
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව- කොළඹ - **0094-115329207/0094115329245** - පුරවැසි අංශය


ඔබ වෙනුවෙන් වඩා යහපත් සේවාවක් සැපයීම සඳහා ඔබගේ දායකත්වය
අප උපරිමයෙන් අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකා තානාපති - ඉතාලිය